රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 22/99 (XXXVIII)

මගේ අංකය: EST-6/05/TPR/1010-1
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2020.02.08

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>රාජ්‍ය නිලධරයන්/ පළාත් රාජ්‍ය නිලධරයන්/ අධිකරණ නිලධරයන් සඳහා නිල ප්‍රවාහන පහසුකම්</u>**

රජයේ නිලධාරීන්/ අධිකරණ නිලධාරීන්/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල නිලධාරීන් සඳහා නිල ප්‍රවාහන පහසුකම් යන මැයෙන් නිකුත් කර ඇති 2011.10.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99(XX)න් හා රාජ්‍ය නිලධරයන්/ පළාත් රාජ්‍ය නිලධරයන්/ අධිකරණ නිලධරයන් සඳහා ප්‍රවාහන පහසුකම් යන මැයෙන් 2017.11.17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99(XXXIV)න් සංශෝධිත 2010.07.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 (XV) කෙරෙහි අවධානය යොමු කරවමි.

02. එම චක්‍රලේඛයේ 03 ඡේදයේ දක්වා ඇති ඇමුණුම 1හි II කාණ්ඩයෙහි අංක I යටතේ සඳහන් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් තනතුර ඉන් ඉවත් කර පහත සඳහන් නව තනතුරු ද සමග I කාණ්ඩයට ඇතුළත් කර I කාණ්ඩය සංශෝධනය කරනු ලැබේ.

**කාණ්ඩ I :**

(XX) භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්
(XXI) අමාත්‍ය මණ්ඩලයේ නොවන අමාත්‍යාංශයක ලේකම්
(XXII) රාජ්‍ය අමාත්‍යාංශයක ලේකම්

03. මෙම සංශෝධිත විධිවිධාන 2019.11.05 දින හෝ එම දිනට පසු විශ්‍රාම යන නිලධරයන් සඳහා පමණක් අදාළ වේ.

04. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරනු ලැබේ.

එස්. හෙට්ටිආරච්චි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය